# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2025 පෙබරවාරි මස 21 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2025.02.21 දින නිකුත් කරන ලදී)**

**එකතු කළ අගය මත බදු**

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 45.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් (මෙහි මින් මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ:-

(අ) නිර්වාසික තැනැත්තකු විසින් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සේවා සැපයීම මත බදු වගකීමක් පැනවීම සඳහා; සහ

(ආ) සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය අවලංගු කර ඒ වෙනුවට එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමයක් හඳුන්වා දීම සඳහා,

විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ පහත දැක්වෙන සැපයුම්වලට වටිනාකම ශුන්‍ය ලෙස සැලකීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ:-

(අ) සේවායෝජකයකු විසින් ඔහුගේ සේවානියුක්තයන්ට නොමිලේ හෝ සහනදායී මිලට සපයනු ලබන ආහාර හෝ ප්‍රවාහනය;

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිරක්ෂණකරුවකුගෙන් යම් දේශීය රක්ෂණ සමාගමක් වෙත බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන යම් ප්‍රතිරක්ෂණ කොමිස් මුදලක් හෝ යම් වන්දි මුදලක්; සහ

(ඇ) ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් භාවිත නොකළ තැපැල් සහ ආදායම් මුද්දරවල මුහුණත වටිනාකම.

***4 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ලබා දී ඇති බදු නිදහස් කිරීම් සහ එහි නිශ්චිතව දක්වා ඇති ලියාපදිංචි කිරීමේ ආරම්භක සීමාව නොතකා, වාණිජමය කාර්යය සඳහා භාණ්ඩ ආනයනය කිරීමේ හෝ අපනයනය කිරීමේ නිරත වන සෑම තැනැත්තකුම එම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කිරීමට නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***6 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු ඉන්වොයිස් පත්‍රයේ ආකෘතිය නිශ්චිතව දැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***7 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් වාර්තා සැපයීම අනිවාර්ය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***8 වන වගන්තිය***: මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය අවලංගු කිරීම හේතුවෙන් බදු ආපසු ගෙවීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තා මේ වගන්තියේ විෂය ක්ෂේත්‍රය යටතට ගෙන ඒම සහ එම ආපසු ගෙවීම සිදු කිරීමේ ආකාරය නිශ්චිතව දැක්වීම සඳහා; සහ

(ආ) ලියාපදිංචි තැනැත්තකු වන සේවායෝජකයා විසින් 5 වන වගන්තිය යටතේ ආහාර සහ ප්‍රවාහනය සැපයීම සඳහා දරනු ලබන ගෙවීම් යෙදවුම් බද්දක් ලෙස මේ වගන්තියේ විෂය ක්ෂේත්‍රය යටතට ගෙන ඒම සඳහා,

විධිවිධාන සැලැස්වීම වේ.

***9 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***10 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ 2 වන වගන්තිය යටතේ වන බද්ද ගෙවීමට අපොහොසත් වන නිර්වාසික තැනැත්තකු විසින් ගෙවනු ලැබිය යුතු බදු ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා තක්සේරුකරු වෙත බලය ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***11 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 48ආ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ අප්‍රකාශිත සහ නොගෙවූ බදු අය කර ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***12 වන වගන්තිය:*** මේ වගන්තියේ මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එය දෙවන වගන්තිය මඟින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***13 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ:-

(අ) "සුදුසුකම් ලබන ආනයනකරු" සහ "සකස් නොකළ කෘෂිකාර්මික නිෂ්පාදන" යන යෙදුම් සඳහා අර්ථ නිරූපණ ඇතුළත් කිරීම; සහ

(ආ) 2 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනවලට ආනුෂංගික සංශෝධන සිදු කිරීම පිණිස "බදු අය කළ හැකි කාලසීමාව" යන යෙදුමේ අර්ථ නිරූපණය සංශෝධනය කිරීම,

වේ.

***14 වන වගන්තිය:*** මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ කොටසේ නීතිය බලපෑම වනුයේ (අ) සහ (ආ) ඡේදවලට අලුත් අයිතම ඇතුළත් කිරීම වේ.

**එල්.ඩී. -ඕ 81/2024**

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය

1. (1) මේ පනත 2025 අංක     දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) 3 වන වගන්තියේ (1) වන ඡේදය මගින් කරන ලද සංශෝධනය හැර මේ පනතේ විධිවිධාන මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ පනතක් බවට පත්වන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) 3 වන වගන්තියේ (1) වන ඡේදය මගින් කරන ලද සංශෝධනය 2024 ජනවාරි මස 1 වන දිනයේ දී ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මේ පනතේ මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ “ආනයනය කිරීම මත,” යන වචන වෙනුවට, “ආනයනය කිරීම මත; හෝ” යන වචන ආදේශ කිරීමෙන්;

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

“(ඇ) 2025 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, නිර්වාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ තැනැත්තකු වෙත ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සේවා සැපයීම මත,”

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ ''භාණ්ඩ හා සේවා සැපයීම මත'' යන වචන වෙනුවට, ''2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා භාණ්ඩ හා සේවා සැපයීම මත'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ-

(අ) එහි (ඊ) අනුඡේදයේ ''ආනයනය කරන යම් ෆැබ්රික් හෝ උපාංග'' යන වචන වෙනුවට, ''2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර ආනයනය කරන යම් ෆැබ්රික් හෝ උපාංග'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානයේ, -

(i) එහි (vi) වන අනුඡේදයේ ''ආනයනය කරනු ලබන'' යන වචන වෙනුවට, ''2025 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආනයනය කරනු ලබන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) එහි (vii) වන අනුඡේදයේ ''ආනයනය කරනු ලබන'' යන වචන වෙනුවට, ''2025 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආනයනය කරනු ලබන'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''පිරිවැය විය යුතු ය.'' යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

''පිරිවැය විය යුතු ය:

එසේ වුව ද, සේවායෝජකයකු විසින් නොමිලයේ හෝ සහනදායී මිලට ඔහුගේ සේවානියුක්තයන්ට ආහාර හෝ පදිංචි ස්ථානය සහ කාර්යාලය අතර මෝටර් කෝච් රථයක් මගින් ප්‍රවාහන පහසුකම් සපයා ඇති අවස්ථාවක, එම සැපයුම් සහ සේවාවල වටිනාකම 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා ශුන්‍ය ලෙස සැලකිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (15) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(16) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන කාලසීමාව සඳහා -

(i) ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිරක්ෂණකරුවකුගෙන් බැංකුවක් හරහා යම් දේශීය රක්ෂණ සමාගමක් වෙත විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන යම් ප්‍රතිරක්ෂණ කොමිස් මුදලක් හෝ යම් වන්දියක්; සහ

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ හෝ එහි පළාත් සභාවක යම් භාවිත නොකළ තැපැල් සහ ආදායම් මුද්දරවල මුහුණත වටිනාකම,

ශුන්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (viii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

"(xi) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ එදිනට පසුව, වාණිජමය කාර්ය සඳහා ආනයනය කරනු ලබන හෝ අපනයනය

කරනු ලබන භාණ්ඩ මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ, “ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කරන්නකු වන සෑම තැනැත්තකු ම” යන වචන වෙනුවට, “10 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති යම් ආනයනය කරන්නකු හැර, ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කරන්නකු වන සෑම තැනැත්තකු ම” යන වචන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

“(2අ) මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා වන බදු ඉන්වොයිස් පත්‍රයේ ආකෘතිය කොමසාරිස්-ජනරාල්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චිතව දක්වනු ලබන පරිදි විය යුතු ය.”;

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්: -

“(1) (අ) සෑම ලියාපදිංචි තැනැත්තකු විසින් ම -

(i) 2013 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, එම එක් එක් බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ විසි

වන දිනයට වඩා පසු නොවී, ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ සැපයුම් පිළිබඳ වාර්තාවක්, ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයකින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය;

(ii) 2013 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන එහෙත් 2025 ජුලි මස 1 වන දිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, එම එක් එක් බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසන් දිනට වඩා පසු නොවී, ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ සැපයුම් පිළිබඳ වාර්තාවක්, ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයකින් කොමසාරිස්-ජනරාල්වරයා වෙත සැපයිය යුතු ය;

(iii) 2025 ජුලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා, එම එක් එක් බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එළඹෙන මාසයේ අවසන් දිනට වඩා පසු නොවී, ඒ බදු අය කළ හැකි කාලසීමාව තුළ ඔහුගේ සැපයුම් පිළිබඳ වාර්තාවක්, ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් කොමසාරිස්-ජනරාල්වරයා වෙත සැපයිය යුතු අතර, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා ජනනය වන එම වාර්තාව ලැබුණු බව සඳහන් පණිවුඩයක් වාර්තාව සපයනු ලබන අවස්ථාවේ දී නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කොමසාරිස්-ජනරාල්වරයා විසින් යෝග්‍ය යයි සලකනු ලබන විශේෂ අවස්ථානුගත කරුණුවල දී, වාර්තාවක් ලිඛිතව ගොනු කිරීමට ඉල්ලීමක් කරන තැනැත්තකුට කොමසාරිස්-ජනරාල්වරයා විසින් ඒ සඳහා අවසර ලබා දිය හැකි ය.

(ආ) එවැනි සෑම වාර්තාවක් ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි එම සියලු විස්තර සහ අදාළ උපලේඛන අන්තර්ගත වන නිශ්චිත ආකෘතියෙන් විය යුතු ය;

(ඇ) මේ උපවගන්තියේ කාර්ය සඳහා “ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්” යන්නෙන් පරිගණක පද්ධතියක් හෝ ජංගම ඉලෙක්ට්‍රොනික උපාංගයක් භාවිත කිරීම අදහස් වේ.”; සහ

(2) (1ආ) වන උපවගන්තියේ “නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.” යන වචන වෙනුවට, “ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් නිවේදනයක් නිකුත් කරනු ලැබිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ -

(අ) එහි (ඈ) ඡේදයේ “යම් බදු අය කළ හැකි කාලසීමාවක, 2 වන වගන්තිය යටතේ අවලම්භනය කරන ලද බද්ද” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර යම් බදු අය කළ හැකි

කාලසීමාවක් සම්බන්ධයෙන්, 2 වන වගන්තිය යටතේ අවලම්භනය කරන ලද බද්ද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ඉ) ඡේදයේ -

(i) "2011 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2011 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් 2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙර බලපැවැත්වෙන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) "වැඩි වූ අවස්ථාවක" යන වචන වෙනුවට, "වැඩි වූ අවස්ථාවක; සහ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්: -

"(ඊ) (i) 2024 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වන කාලසීමාව සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (i) වන අයිතමයේ සහ (ii) වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති; හෝ

(ii) 2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු යම් කාලසීමාවක් සඳහා මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසේ (ආ) ඡේදයේ (xx) වන අයිතමයේ සහ (xxi) වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති,

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ හඳුනාගනු ලබන යම් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා හෝ විශේෂ ව්‍යාපෘතියක් සඳහා හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ II වන කොටසේ (ඊ) ඡේදයේ (ii) වන අයිතමය යටතේ හෝ මේ පනතේ පළමුවන උපලේඛනයේ III වන කොටසේ (ආ) ඡේදයේ (xxi) වන අයිතමය යටතේ අමාත්‍යවරයා විසින් හඳුනාගනු ලබන යම් විශේෂිත ව්‍යාපෘතියක් වෙත, භාණ්ඩ හෝ සේවා සපයන්නා වූ එම බදු අය කළ හැකි කාලසීමාව තුළ භාණ්ඩ හෝ සේවා සැපයුම්වල වටිනාකම ඔහුගේ මුළු සැපයුම්වලින් සියයට පනහකට වැඩි වූ ද යම් ලියාපදිංචි තැනැත්තකුගේ හෝ මේ පනතේ 83 වන වගන්තිය යටතේ අර්ථ නිරූපණය කර ඇති සුදුසුකම් ලබන ආනයනකරුවකුගේ හෝ,

2 වන වගන්තිය යටතේ විලම්භනය කරන ලද බදු ඇතුළුව යෙදවුම් බද්දේ අතිරික්තයක් පවතින අවස්ථාවක,";

(ඇ) එහි (ඇ) අනුඡේදයේ "2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2011 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන සහ 2025 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර අවසන් වන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඉ) (ඇ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්: -

"(ඈ) අතිරික්තය 2025 ඔක්තෝබර් 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සම්බන්ධයෙන් වන්නේ නම්, එම අතිරික්තය -

(i) 21 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාරව සියලු විස්තර අන්තර්ගත වන නිසි වාර්තාවක් සැපයීමෙන් පසුව; සහ

(ii) එම බදු අය කළ හැකි කාලසීමාව ඉකුත් වීමෙන් පසු එළඹෙන මාසයේ අවසාන දිනය හෝ අදාළ බදු අය කළ හැකි කාලසීමාව සඳහා වන වගන්තියේ (1ආ) වන උපවගන්තිය යටතේ දැන්වීමක් නිකුත් කිරීමෙන් පසුව (i) වන අනුඡේදයේ සඳහන් කරන ලද නිසි වාර්තාවක් සපයන ලද දිනය, යන දිනවලින් පසුව එළඹෙන දිනයේ සිට දින හතළිස් පහකට වඩා පසු නොවන දිනයක දී,

ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන අවදානම් මත පදනම් වූ ආපසු ගෙවීමේ යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව ආපසු ගෙවනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ -

(අ) එහි (vi) වන ඡේදයේ "7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "මේ (සංශෝධන) පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා, 7 වන වගන්තියේ

(1) වන උපවගන්තියේ දක්වා ඇති'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානයේ -

(i) (ආ) ඡේදයේ ''III වන කොටසේ (ආ) ඡේදයේ (xxv) වන සහ (xxvi) වන අයිතමවල'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, ''III වන කොටසේ (ආ) ඡේදයේ (xx) වන සහ (xxi) වන අයිතමවල'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) ''(ආ) ඡේදයේ (xxvi) වන අයිතමය'' යන වචන සහ ඉලක්කම් වෙනුවට, ''III වන කොටසේ (ආ) ඡේදයේ (xxi) වන අයිතමය'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.;

(ඇ) එහි දෙවන අතුරු විධානයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අතුරු විධානය එකතු කිරීමෙන්: -

''එසේම තවදුරටත්, (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ලියාපදිංචි තැනැත්තකු වශයෙන් සේවා යෝජකයා විසින්, 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානයේ දක්වා ඇති ලද ප්‍රතිලාභයක් වන ආහාර සහ ප්‍රවාහනය සැපයීම බාහිර තැනැත්තකුගෙන් ලබා ගැනීම මත ඔහු විසින් දරනු ලබන ගෙවීම් මත වන බදු, එම ප්‍රතිලාභයේ අගය ශුන්‍ය වීම නොසලකා, එම ලියාපදිංචි තැනැත්තාගේ යෙදවුම් බදු බැර වශයෙන් සලකනු ලැබීමට ඉඩ දෙනු ලැබිය හැකි ය.'';

(3) ඒ වගන්තියේ (10) වන උපවගන්තියේ -

(අ) එහි දෙවන අතුරු විධානයේ (ii) වන අයිතමයේ “කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන මාර්ගෝපදේශවල” යන වචන වෙනුවට, “කොමසාරිස්-ජනරාල්වරයා විසින් 2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව වන යම් කාලසීමාවක් සඳහා නිශ්චිතව දක්වනු ලබන මාර්ගෝපදේශවල” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි තුන්වන අතුරු විධානයේ -

(i) එහි “(ආ) ඡේදයේ (xxvi) වන අයිතමය” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “III වන කොටසේ (ආ) ඡේදයේ (xxi) වන අයිතමය” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) එහි (ආ) ඡේදයේ “III වන කොටසේ (ආ) ඡේදයේ (xxv) වන සහ (xxvi) වන අයිතමවල” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “III වන කොටසේ (ආ) ඡේදයේ (xx) වන (xxi) වන අයිතමවල” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, එහි (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම

“(1ආ). මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ශ්‍රී ලංකාවේ

තැනැත්තකු වෙත ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් සේවා සපයන නිර්වාසික තැනැත්තකු සම්බන්ධයෙන් වන විට, එම සැපයුම මත යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා ගෙවනු ලැබිය යුතු බදු, නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහ කොමසාරිස්-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාර්යපටිපාටියට යටත්ව ගෙවනු ලැබිය යුතු ය.

ඉහත දක්වා ඇති පරිදි ගෙවනු නොලබන යම් බදු මුදලක් හිඟ තබා ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, බදු ගෙවිය යුත්තේ යම් බද්දක් එක් අයකුට වඩා වැඩි පිරිසක් විසින් ගෙවිය යුතු අවස්ථාවක, එම එක් එක් තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ගෙවීම පැහැර හැර ඇති අයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ උපවගන්තියේ කාර්ය සඳහා-

"ඉලෙක්ට්‍රොනික වේදිකාවක්" යන්නෙන්, සේවා සපයන්නන් එක් අයකු හෝ වැඩි ගණනක් විසින් ඔවුන්ගේ සේවාවන් සේවාලාභීන් වෙත ලබා දීම සඳහා භාවිත කරන වෙබ් අඩවියක හෝ ජංගම යෙදුමක ආකෘතියකින් වූ යම් කාර්යපටිපාටියක් අදහස් වේ.

"ස්ථිර ස්ථානය" යන්නෙන්, සේවා සැපයීම සඳහා හෝ එහි ස්වකීය අවශ්‍යතා සඳහා සේවා ලබා ගැනීම සහ භාවිත කිරීම සඳහා මානව සහ තාක්ෂණික සම්පත් ප්‍රකාරව ප්‍රමාණවත් ස්ථාවරත්වයක් සහ සුදුසු ව්‍යුහයක් මගින් සංලක්ෂණය කරන ලද ස්ථානයක් අදහස් වේ.

"නිර්වාසික තැනැත්තා" යන්නෙන්, ඇතැම් විට ප්‍රධානියා හෝ අනුයෝජිතයා ලෙස හෝ වෙනත් යම් තත්ත්වයකින් සේවා සැපයීම සම්බන්ධ වන ගනුදෙනු සිදු කරන, නමුත් ශ්‍රී ලංකාව තුළ ස්ථිර

ව්‍යාපාරික ස්ථානයක් නොමැති යම් තැනැත්තකු අදහස් වන අතර, ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් නොමැතිව නමුත් 55 වන වගන්තියේ සඳහන් කරනු ලැබූ පරිදි එම තැනැත්තා වෙනුවෙන් කටයුතු කිරීමට අනුයෝජිතයකු සිටින ශ්‍රී ලංකාව තුළ බදු අය කළ හැකි කටයුතු සිදු කරන හෝ පවත්වාගෙන යන 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි තැනැත්තකු ඊට ඇතුළත් නොවේ.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

(1) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඉල්ලා සිටින අවස්ථාවක," යන වචන වෙනුවට, "ඉල්ලා සිටින අවස්ථාවක; හෝ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්: -

"(ඈ) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව නිර්වාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ තැනැත්තකු වෙත ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සේවා සැපයීම මත යම් තැනැත්තකුගෙන් බදු අය කර ගත යුතු අවස්ථාවක,''.

ප්‍රධාන ප්‍රඥප්තියට 48ආ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 48අ වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 48ආ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය: -

"අප්‍රකාශිත සහ නොගෙවූ බදු අය කර ගැනීම

48ආ. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් තැනැත්තකු, ඔහු විසින් නිකුත් කරන ලද ඉන්වොයිස් පත්‍රයේ දක්වා ඇති බද්දට යටත් වන භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා, ඔහු

විසින් එකතු කරන ලද බදු ගෙවා නොමැති අවස්ථාවක, එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි වී ඇති බව හෝ ලියාපදිංචි වී නැති බව නොතකා කොමසාරිස්-ජනරාල්වරයා විසින් එම තැනැත්තාගෙන් එම බදු වහාම එකතු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ (ii) වන ඡේදයේ (ආ) අනුඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

"(ආ) 2014 ජනවාරි මස 1 වන දින සිට හෝ එදිනට පසුව එහෙත් 2025 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව වූ යම් කාලසීමාවක් සඳහා සියයට හයක්; සහ

(ඇ) 2025 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසුව වන යම් කාලසීමාවක් සඳහා සියයට දහයක්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

(1) "අධ්‍යාපන සේවා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්: -

"සුදුසුකම් ලබන ආනයනකරු" යන්නෙන්, කලින් ලිත් වර්ෂය තුළ දී මේ පනතේ 7 වන වගන්තිය යටතේ ශුන්‍ය-අනුප්‍රමාණගත සැපයුම් වටිනාකම එම කාලසීමාව තුළ දීම එම තැනැත්තා විසින් කරන ලද සැපයුම්වල මුළු වටිනාකමෙන් සියයට පනහකට වඩා වැඩි ලියාපදිංචි තැනැත්තකු අදහස් වේ;"; සහ

(2) "බදු අයකළ හැකි කාලසීමාව" යන යෙදුමේ අර්ථ නිරූපණයේ -

(අ) (2) වන ඡේදයේ “2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන යම් කාලසීමාවක් සඳහා” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භවන, එහෙත් 2025 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් කාලසීමාවක් සඳහා” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (2) වන ඡේදයේ (ආ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

“(3) 2025 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා -

(අ) එක් මාසයක කාල සීමාවක් සඳහා;

(ආ) (අ) ඡේදයේ සඳහන් නොවන තැනැත්තකු හෝ කොමසාරිස්-ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමතය මත කාර්තුමය වශයෙන් වාර්තා ඉදිරිපත් කිරීමට තෝරා ගන්නා ලියාපදිංචි තැනැත්තකු සම්බන්ධයෙන් එක් එක් වර්ෂයේ පිළිවෙළින්, ජනවාරි මස පළමුවන දිනයෙන්, ජූලි මස පළමුවන දිනයෙන් සහ ඔක්තෝබර් මස පළමුවන දිනයෙන් ආරම්භවන මාස තුනක කාලසීමාවක් සඳහා.”; සහ

(3) “විදුලි සංදේශ සේවා” යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්: -

“සකස් නොකළ කෘෂිකාර්මික නිෂ්පාදන” යන්නෙන්, භූමියේ හෝ හරිතාගාරයක

වගා කරන ලද යම් ශාකවලින් නිෂ්පාදනය කරන ලද යම් නිෂ්පාදන අදහස් වන අතර, එම නිෂ්පාදන පිරිසිදු කිරීම, ප්‍රමාණකරණය කිරීම, තේරීම, වර්ග කිරීම, කැපීම හෝ ශීත කිරීම මගින් විකිණීම සඳහා සකස් කරනු ලබන නිෂ්පාදන ඊට ඇතුළත් වේ;".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය, එහි III වන කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

(1) (අ) ඡේදයේ (x) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්: -

"(xi) විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයනු ලැබීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සපයනු ලබන රසායනික නැප්තා;";

(2) (ආ) ඡේදයේ (xxvi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්: -

"(xxv) දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කරනු ලබන දියර කිරි සහ යෝගට්;";

(3) (ඇ) ඡේදයේ (iii) වන අයිතමයේ "රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති ගුවන්යානා එන්ජින් හෝ ගුවන්යානා අමතර කොටස්" යන වචන වෙනුවට, "මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව වන, රේගු කාර්යය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණය ශීර්ෂ අංක යටතේ

හඳුනාගෙන ඇති ගුවන්යානා එන්ජින් හෝ ගුවන්යානා අමතර කොටස්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

15. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.